320

RARE

# තිරසර සංවර්ධනය හා ගුවන්විදුලි සන්නිවේදනය

(රජරට, ස්වදේශීය හා සිරස ගුවන්විදුලි සේවා ආශ්‍රිතව කෙරෙන අධ්‍යයනයකි.)

එස්.එම්.ජී.කපිල සිරිවර්ධන
F.G.S. 03/02/06/2000/03/



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 320 |
| වර්ග අංකය | |



කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදනය පිළිබඳ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

2003 ජුලි

**නිබන්ධ සාරාංශය**

ස්වදේශීය, රජරට හා සිරස ගුවන් විදුලි සේවා තුළින්, නව ගොවිජනපදවල සිදුකරන පාරිසරික අධ්‍යාපනික බලපෑම, තිරසර සංවර්ධන පදනමක සිට අධ්‍යයන කිරීමේදී, අවධානය යොමු වූ ප්‍රධාන ගැටළුව වූයේ, ගොවිජනපද සමාජ තුළ පරිසර අධ්‍යාපන සඳහා ගුවන්විදුලි මාධ්‍ය බලපායිද? බලපෑමේ ස්වභාවය කෙසේද? වෙනස් වූ සමාජ ආර්ථික පරිසර දෙකක එය, වෙනස් වන්නේ කෙසේද? යන්න පිළිබඳවය. ඉහත ගැටළුවලට පිළිතුරු සෙවීමේදී, ප්‍රශ්නමාලා ක්‍රමය (Questionnaire) සම්මුඛ සාකච්ජා (Interview) නිරීක්ෂණ (Observation) හා ප්‍රත්‍යයක අධ්‍යයන (Case Study) ක්‍රම යොදා ගැනිණි. එහිදී, හඳුනාගත හැකි වූ කරුණක් වන්නේ, පරිසරය පිළිබඳ දැනුම ලබා ගැනීමේදී ජනමාධ්‍ය බලපෑම ඉතා අඩු වේ. නමුත්, එබඳු වාතාවරණයක, ගුවන්විදුලි මාධ්‍ය, සෙසු මාධය අභිභවා සිටී. බොහෝවිට පරිසරය ප්‍රයෝජනයට ගැනෙන්නේ, තමන් ලබන අත්දැකීම්වලිනි. ගොවි සංවිධාන හා නිලධාරීන්, ගොවි ජනපදවල පරිසරය සම්බන්ධ දැනුම ව්‍යාප්ත කිරීමේදී, ප්‍රබල සන්නිවේදන ක්‍රම දෙකකි. ගුවන්විදුලි සේවාවන් අතර පරිසර වැඩසටහන් වැඩි වශයෙන් විකාශනය වන්නේ, ස්වදේශීය සේවයෙනි. ගුවන්විදුලි සේවා ඔස්සේ සැලකිය යුතු ප්‍රමාණයක් වැඩසටහන් විකාශනය වුවත්, ඒවා අතරින් ජානපදිකයින් අසන්නේ සුළු වශයෙනි. එයට, ප්‍රධාන කරුණක් වන්නේ, ඇසිය හැකි කාලපරිච්ජේදවල ඒවා විකාශනය නොවීමයි. ආර්ථික වශයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි, කෘෂිකර්මය හා සම්බන්ධ පාරිසරික ගුවන්විදුලි වැඩසටහන් පිළිබඳ අවධානය යොමු වුවත්, බොහෝ පරිසර අවබෝධයන් ලබන්නේ, අවිධිමත් සන්නිවේදන රටාවන් ඔස්සේය. ගැමියන්, බහුල වශයෙන්, පෞද්ගලික ගුවන්විදුලි සේවාවන්හි වැඩසටහන් අසන්නේ, විනෝදාස්වාදය හා තොරතුරු දැන ගැනිමක් වශයෙනි. ඒවායේ පාරිසරික දැනුම ව්‍යාප්ත නොවන තරම්ය. නමුත්, ජානපදිකයින් විසින් පාරිසරික දැනුම ව්‍යාප්ත වන, රාජ්‍ය මාධ්‍ය අසන්නේ සුළු වශයෙනි. එය, තිරසර සංවර්ධන සන්නිවේදන කාර්ය හා සම්බන්ධ ගැටළුවකි. එසේ අසන අය බොහෝවිට දැනුම ලබාගැනීමේ අභිලාෂයක් ඇත්තවුන් වන බවද පෙනේ. ගුවන්විදුලි මාධ්‍ය ඔස්සේ, පාරිසරික වශයෙන් වැඩි බැලපෑමක් ඇත්තේ, වෘක්ෂලතා හා ජලසම්පත් පිළිබඳ වැඩසටහන්වලිනි.

ජාත්‍යන්තර පාරිසරික ප්‍රශ්න පිළිබඳව, ජානපදිකයින්ට ඇත්තේ සුළු අවබෝධයකි. එහිදී, මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රබල මෙහෙයක් කළ හැකිය. එබැවින්, පරිසර අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමේදී, විධිමත් පාසල් අධ්‍යාපනය මූලික වශයෙන් ලබාදීමේ වටිනාකමක් තිබේ. එමෙන්ම, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් තිරසර සංවර්ධන සන්නිවේදන සංකල්පයක් ක්‍රියාත්මක කිරීමේ වටිනාකමක් තිබේ.